# 6 ඔංචිලි වාරම්

අලුත් අවුරුදු උත්සව කාලෙට ළමා, වැඩිහිටි කවුරුත් ඔංචිලි පදිනවා. ඔංචිලි පදිනකොට ගීත ගායනා කිරීම පැරණි සිරිතක්. ඒවාට ඔංචිලි වාරම් කියල කියනවා. පහත දැක්වෙන්නේ එවැනි ගීත කිහිපයකි.

(1) ඔංචිලි චිලි චිල්ල මලේ
වැල්ල දිගට නෙල්ලි කැලේ
කඩන්න බැරි කටු අකුලේ
කඩා දියන් මගේ මලේ

(2) රජ්ජුරුවෝ උඩයි උඩයි
බිම ඉන්නේ වැසියො තමයි
අහසේ උඩ නගියි නගියි
පදිමු අපිත් එහෙයි මෙහෙයි

(3) අත්ත උසං උසං උසං
ජම්බු පොකුරු සිලිං බිලිං
ලොකු අක්කේ පදිං පදිං
ජම්බු කඩං බෙදං බෙදං



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



4) වවුල් දහයි දහයි දහයි
කොක්කු දහයි දහයි දහයි
අහසේ උඩ නගියි නගියි
පදිමු අපිත් එහෙයි මෙහෙයි

## ක්‍රියාකාරකම 1

(i) හඬ පටයක ආධාරයෙන් හෝ වෙනත් එබඳු ක්‍රමයකින් හෝ මේ කවිපෙළෙහි තාලානුකූල ගායනයකට සවන් දෙන්න.

(ii) එම තාලයට අනුව කවි පෙළ තනි තනි ව හා සාමූහික ව ගායනා කරමින් රස විඳින්න.

(iii) ගුරුවරයාගේ හෝ වෙනත් බාහිර උදව් ඇති ව හෝ නැති ව හෝ විවිධ තාලවලට අනුව මේ කවි පෙළ ගායනා කරන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(iv) සුදුසු අංගචලන යොදමින් විවිධ තාලවලට මෙම කවි පෙළ ගායනා කරන්න.

(v) කවි පෙළ කටපාඩමින් ගායනා කරන්න.

## ක්‍රියාකාරකම 2

(i) මෙම කවි පෙළෙහි ඔබ වඩාත් කැමති කවියක් නැවතත් විවිධ තාලවලට ගායනා කරන්න.

(ii) අන් අයගේ ගායනයට සවන් දෙමින් තාල තබා රස විඳින්න.

## ක්‍රියාකාරකම 3

(i) විවිධ තාලවලට ගායනා කළ හැකි වෙනත් කවි පන්ති එක් රැස් කර පන්තිය ඉදිරියේ ගායනා කරන්න.

(ii) එම ගායනාවලට සවන් දී තාල තබමින් රස විඳින්න.

## ක්‍රියාකාරකම 4

පන්තිය පිල් දෙකකට බෙදී පහත සඳහන් කවිය ගායනා කරන්න.

★ **මේ කොයි යන්නේ**

| | | |
|---|---|---|
| පළමු පිල | - | මේ කොයි යන්නේ |
| දෙවන පිල | - | රයිගම් යන්නේ |

පළමු පිල - කවදා එන්නේ

දෙවන පිල - ඉරිදා එන්නේ

පළමු පිල - මක්කයි ගේන්නේ

දෙවන පිල - කැවුම් ගේන්නේ

පළමු පිල - කාට ද දෙන්නේ

දෙවන පිල - නැන්දට දෙන්නේ

## ක්‍රියාකාරකම 5

★ පාඩමේ ඇති පහත සඳහන් කවි පදය කියවන්න.

බිම ඉන්නේ වැසියෝ තමයි.

★ ඉරි ඇඳි පද කෙරෙහි සැලකිලිමත් වෙමින් එවැනි තවත් වාක්‍ය කියන්න.

- අපි කඩන්නේ නෙල්ලි තමයි.
- ජම්බු තියෙන්නේ ගහේ තමයි.
- පාඩම් කරන්නේ රෑ විතර ද?
- කෑමට ගන්නේ එළවළු විතර ද?
- නොමග යන්නේ නෑ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 6

වරහන් තුළින් සුදුසු පද තෝරා ගෙන පහත සඳහන් ඡේදයෙහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

(උගන්වන්නේ, ඉන්නේ, දෙන්නේ, යන්නේ, කන්නේ, එන්නේ )

මම ගෙදරින් ..................... උදේ හතට. උදේට ..................... බත්. මට බත් ..................... මගේ අම්මා. මම පාසලට ..................... පයින්. මාත් එක්ක ..................... මාගේ යාළුවෝ. පාසලේ දී අපට ..................... ගුරුවරු.

## ක්‍රියාකාරකම 7

දී ඇති උදාහරණය සැලකිල්ලට ගෙන පහත සඳහන් වචන යොදා වාක්‍ය හදන්න.

උදාහරණය :- අපි ඉගෙන ගන්නේ සිංහල.

(i) යන්නේ

(ii) කන්නේ

(iii) පදින්නේ

(iv) කඩන්නේ

(v) තියෙන්නේ

## ක්‍රියාකාරකම 8

★ ඉරි ඇඳි පද කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් ඡේදය කියවන්න.

මම ගෙදරින් ආවේ උදේ හතට. උදේට කෑවේ බත්. මට බත් දුන්නේ මගේ අම්මා. මම පාසලට ගියේ පයින්. මාත් එක්ක හිටියේ මගේ යාළුවෝ. පාසලේ දී අපට ඉගැන්නුවේ ගුරුවරු.

★ අංක 6 ක්‍රියාකාරකම බලන්න. එහි ඔබ විසින් හිස්තැනට යොදන ලද වචන සහ ඉහත අංක 8 ක්‍රියාකාරකමෙහි ඇති ඉරි ඇඳි පදවල වෙනස වටහා ගනිමින් ඉහත ඡේදය නැවත කියවන්න.

## ක්‍රියාකාරකම 9

පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) මම ඊයේ උදේට ..................... හොදියි බතුයි.

( කෑවේ / කන්නෙ )

(ii) අපි පසුගිය නිවාඩුවට ගමේ ........................... නෑ.

( යන්නේ / ගියේ )

(iii) ගිය අවුරුද්දෙ මම .............................. හයවන පන්තියේ ( ඉන්නේ / හිටියේ )



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(iv) ඊයේ මම පාසලට ........................... බසයෙන්.
( ආවේ / එන්නේ )

(v) පෙරේදා පාඩමට ............................ සිංහල කවි.
( උගන්නන්නේ / ඉගැන්නුවේ )

## ක්‍රියාකාරකම 10

දී ඇති උදාහරණය සැලකිල්ලට ගෙන පහත සඳහන් වචන යොදා වාක්‍ය හදන්න.

උදා:- මම ඊයේ හොඳින් වැඩ කළේ නැහැ.

(i) ගියේ
(ii) කළේ
(iii) කැඩුවේ
(iv) නැටුවේ
(v) බැලුවේ

## ක්‍රියාකාරකම 11

**රස විඳිමු.**

සමනලයයි - මී මැස්සයි
කුමරි වගේ - අහසෙ නටයි
සුදු මිදුලයි - පිට්ටනියයි
දෙක ම එක ම - මල් යහනයි





නොමිලේ බෙදා හැරීම සඳහා ය.